## නල්ලූර් ප්‍රාදේශීය සභාව
## යාපනය දිස්ත්‍රික්කය
-----------------------------

### 1. මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 05 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1:2 මතය
------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව නල්ලූර් ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට නල්ලූර් ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.2 ගණුම්කරණ අඩුපාඩු
---------------------------

වියදම් හා වත්කම් වලට අදාලව ගිණුම් වල නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු අවස්ථා ගණන හා වටිනාකම යටතේ පහත වගුවෙහි දැක්වේ.

| | වියදම් | | වත්කම් | |
|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. |
| ගිණුම්වල වැඩියෙන් දැක්වීම් | 01 | 625 | - | - |
| ගිණුම්වල අඩුවෙන් දැක්වීම | - | - | 01 | 10,911,793 |
| ගිණුම්වලින් අත්හැරීම් | - | - | 01 | 686,640 |

### 1:3:3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 කට වැඩි කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.2,099,951 ක් විය.

### 1:3:4 විගණනය සඳහා සාක්ෂි නොවීම

**විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.84,571,721ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1:3:5 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වල විධිවිධාන වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 5 | මුදල් එකතු කිරීම හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් වගකීම පැවරුණු නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් ඇප ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2007 මාර්තු 03 දිනැති එකතු කළ අගය මත බදු රඳවා ගැනීම් පිළිබඳ චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළදී එකතු කළ අගය මත බදු රඳවා ගැනීම් ලෙස රැස්කරගත් රු.12,415 ක මුදලක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කර නොතිබුණි. |
| 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත 153 වගන්තිය | රු.779,531 ක් වූ රඳවා ගැනීමේ බදු අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.61,954,464 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.34,464,527 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම්

සභාපති විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i). | වරිපනම් හා බදු | 3,045 | 2,703 | 5,976 | 3,015 | 2,600 | 8,953 |
| (ii). | බදු කුලී | 32,170 | 45,757 | 1,004 | 9,872 | 14,311 | 405 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 835 | 1,189 | 12 | 835 | 843 | - |
| (iv). | වෙනත් ආදායම් | 51,722 | 47,232 | 19,531 | 46,891 | 48,166 | - |

## 2:2:2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ යාපනය මහෙස්ත්‍රාත් අධිකරණය මඟින් එකතු කර ප්‍රධාන ලේකම් වෙත ප්‍රේෂණය කරන ලද 2010 දෙසැම්බර් 31 දක්වා සභාවට ලැබිය යුතු රු.1,810,700 ක් වූ උසාවි දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.2.3 මුද්දර ගාස්තු

2010 වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන ලැබිය යුතු මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.2.4 ආදායම් ණයගැතියෝ

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත හා 1998 ප්‍රාදේශීය සභා ( මුල්‍ය හා පරිපාලන ) රීති ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට හා පෙර වර්ෂ වලට අදාලව 2010 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු රු.33,333,097 ක් වූ වරිපනම් බදු , බදු කුලී , බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත සහ තථ්‍ය වියදම හා විචලනයන් පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| <u>පුනරාවර්තන වියදම</u> | | | | | | |
| පුද්ගල පඩිනඩි | 34,921 | 28,080 | 6,841 | 31,003 | 26,044 | 4,959 |
| වෙනත් | 8,411 | 6,846 | 1,565 | 6,555 | 5,.412 | 1,143 |
| උප එකතුව | 43,332 | 34,926 | 8,406 | 37,558 | 31,456 | 6,102 |
| ප්‍රාග්ධන වියදම් | 53,935 | 47,024 | 6,911 | 27,250 | 20,930 | 6,320 |
| මුළු එකතුව | 97,267 | 81,950 | 15,317 | 64,808 | 52,386 | 12,422 |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 05 | 04 |
| ද්විතීයික ශ්‍රේණිය | 37 | 35 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 48 | 46 |
| වෙනත් | - | 11 |
| එකතුව | 90 | 96 |

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

රු.275,000 ක් වටිනා ලැන්ඩ් මාස්ටර් ට්‍රැක්ටරයක් වර්ෂ 3 කට වැඩි කාලයක් නිෂ්කාර්යව හා ඌන උපයෝජිතව පැවති බව විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

### 2.5.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුත ගිණුම් ශේෂ රු.28,087,118 ක් වූ අතර වර්ෂ 01 කට වැඩි කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ රු.283,712 ක් විය.

### 2.5.3 අයවිය යුතු සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂවල එකතුව රු.8,451,511 ක් වු අතර, වර්ෂ 01 ක ට වැඩි කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි පැවති ගිණුම් ශේෂ රු.1,679,528 ක් විය.

### 2.5.4 අචල ජංගම වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 කට වැඩි කාලයක් ඉක්මවා පැවතුණු අචල ජංගම වත්කම් වටිනාකම රු.535,322 ක් විය.

**2.5.5 සමීක්ෂණය නොකළ වත්කම්**

--------------------------------

සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණනය කරන ලද වත්කම්වල වටිනාකම රු.99,402,916 ක් විය.

**2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

-----------------------------------------------------------

රු.2,750 ක මුදලක් "NELSIP " නිලධාරීන්ගේ හෝටල් ගාස්තු ලෙස ගෙවා තිබුණි.

**2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **පෞද්ගලික ඉඩමක් මිලදී ගැනීම**

----------------------------------

2002 වර්ෂයේදී ඉඩමක් මිලදී ගැනීම සඳහා සභාව විසින් පුවත්පත් දැන්වීමක් පළ කර තිබුණු අතර එම අවස්ථාවේදී ඉඩමේ සම්පූර්ණ වටිනාකම රු.200,000 ක් විය. එහෙත් සමාලෝචිත වර්ෂයේදී රු.12,035,896 ක වටිනාකමකට ඉහත ඉඩම මිලදී ගෙන තිබුණි. තීරණ ගැනීම සඳහා වූ ප්‍රමාදය හේතුවෙන් සභාවට රු.10,035,896 ක අලාභයක් දැරීමට සිදුවී තිබුණි.

(ආ) නිලධාරියෙකුට සංයුක්ත දීමනා වලට අමතරව හෝටල් ගාස්තු ලෙස රු.2,300 ක මුදලක් ගෙවා තිබුණි.

**2.8 කාර්ය සාධනය**

-----------------

සභාව විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් ගිණුම් වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි. එබැවින් ඉටුකර ගත යුතු අපේක්ෂිත ඉලක්ක හා ඒ පිළිබඳ ප්‍රගතිය තහවුරු කර ගත නොහැකි විය.

**2.9 කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------

**සම්පූර්ණයෙන් අත්හැර දමන ලද ව්‍යාපෘති**

---------------------------------------------

ඇස්තමේන්තුගත වටිනාකම රු.50,000 ක් වූ කම්පන් ප්‍රජා මධ්‍යස්ථානයෙහි ගොඩනැගිල්ලක් ප්‍රතිසංස්කරණය කිරීමේ විමධ්‍යගත අයවැය ව්‍යාපෘතිය ඉඩමේ ආරවුලක් හේතුවෙන් සම්පූර්ණයෙන් අත් හැර දමා තිබුණි.

## 2.10 අභ්‍යන්තර විගණනය

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ). අයවැය පාලනය

(ආ). ආදායම් පරිපාලනය

(ඇ). වත්කම් කළමනාකරණය